(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

**අංක 64.]**

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2016 අප්‍රේල් මස 07 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 10.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **තිලංග සුමතිපාල මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **තලතා අතුකෝරල මහත්මිය,** විදේශ රැකියා අමාත්‍යතුමිය

ගරු **ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා සහ ඉඩම් අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **ෆයිසර් මුස්තාපා මහතා,** පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **සාගල රත්නායක මහතා,** නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පාඨලී චම්පික රණවක මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **මහින්ද සමරසිංහ මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමා

ගරු **ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා

ගරු **විජිත් විජයමුණි සොයිසා මහතා,** වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා

ගරු **ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා,** ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුජීව සේනසිංහ මහතා,** ජාත්‍යන්තර වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ෆයිසාල් කාසිම් මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **අනුරාධ ජයරත්න මහතා,** මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුමේධා ජී. ජයසේන මහත්මිය,** තිරසර සංවර්ධන හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා,** අධිකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා සහ බුද්ධශාසන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් පී. පෙරේරා මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අමීර් අලි සිහාබ්දීන් මහතා,** ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එච්. එම්. එම්. හරීස් මහතා,** ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු **රංජිත් අලුවිහාරේ මහතා**

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා**

ගරු  ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය

ගරු  වේලු කුමාර් මහතා

ගරු  නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා

ගරු  කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු  චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු  චන්දිම ගමගේ මහතා

ගරු  නිහාල් ගලප්පත්ති මහතා

ගරු  දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු  එඩ්වඩ් ගුණසේකර මහතා

ගරු  එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු  ඩී. වී. චානක මහතා

ගරු  සිසිර ජයකොඩි මහතා

ගරු  (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු  නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු  අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු  (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු  පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු  ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු  මයන්ත දිසානායක මහතා

ගරු  විමලවීර දිසානායක මහතා

ගරු  වීරකුමාර දිසානායක මහතා

ගරු  සාලින්ද දිසානායක මහතා

ගරු  ඩග්ලස් දේවානන්ද මහතා

ගරු  මොහොමඩ් නවවි මහතා

ගරු  ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු  කේ. කේ. පියදාස මහතා

ගරු  සුජිත් සංජය පෙරේරා මහතා

ගරු  අශෝක ප්‍රියන්ත මහතා

ගරු  හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු  බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු  තාරක බාලසූරිය මහතා

ගරු  විජිත බේරුගොඩ මහතා

ගරු  එස්. එම්. මරික්කාර් මහතා

ගරු  කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු තිලක් මාරපන මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු බිමල් රත්නායක මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු වමල් රාජපක්ෂ මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු තේනුක විදානගමගේ මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු සන්දිත් සමරසිංහ මහතා

ගරු මුත්තු සිවලිංගම් මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු අලි සාහීර් මවුලානා සෙය්යිඩ් මහතා

ගරු ශෙහාන් සේමසිංහ මහතා

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා

ගරු කනක හේරත් මහතා

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**1. පෙත්සම් :**

(1) පැල්මඩුල්ල, පාතකඩ, මාවුදැල්ලවත්ත යන ලිපිනයෙහි පදිංචි කේ. රූපසිංහ මහතාගෙන් ලැබුණු 2015.10.04 දිනැති පෙත්සම ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා විසින් පිළිගන්වන ලදී.

(2) කොළඹ 02, යුනියන් පෙදෙස, කොල්වින් ආර්. ද සිල්වා මාවත, අංක 440 දරන ස්ථානයෙහි පදිංචි එම්. ඩී. එම්. එන්. දිසානායක මහතාගෙන් ලැබුණු 2016.02.20 දිනැති පෙත්සම ගරු සන්දිත් සමරසිංහ මහතා විසින් පිළිගන්වන ලදී.

අංක 25අ දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**2. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1) :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුව විසින් 2016.03.08 වැනි දින සම්මත කරන ලද යෝජනාවේ විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, අද දින පාර්ලිමේන්තුවේ රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 10.30 සිට අ. භා. 7.30 දක්වා විය යුතු ය. අ. භා. 1.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7(5) ඡේදය ක්‍රියාත්මක විය යුතු ය. අ. භා. 7.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල්තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2) :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2016 මැයි මස 03 වැනි අඟහරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**4. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු කේ. කාදර් මස්තාන් මහතා, ගරු සන්දිත් සමරසිංහ මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"අල් ජමියාතුල් ගෞෂියා සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා වෙත පවරන ලදී.

(පූ. භා. 10.55 ට නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.)

**5. ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ නියෝග :** ක්‍රීඩා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 3 වගන්තිය සමඟ කියවිය යුතු 34 වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 ජනවාරි 18 දිනැති අංක 1950/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.03.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

නියෝජ්‍ය කථානායකතුමා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

**I**

"2016 පෙබරවාරි මස 26 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරගත් යෝජනාව ප්‍රකාරව සහ 2015 ඔක්තෝබර් මස 23 වැනි දින හා නොවැම්බර් මස 21 වැනි දින කථානායකතුමා විසින් කරන ලද නිවේදනවලට අමතරව, තේරීම් කාරක සභාව විසින් මතු සඳහන් මන්ත්‍රීන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභිකයින් වශයෙන් නම් කර ඇත:-

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා"

**II**

"2016 පෙබරවාරි මස 26 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරගත් යෝජනාව ප්‍රකාරව සහ 2015 ඔක්තෝබර් මස 23 වැනි දින හා නොවැම්බර් මස 21 වැනි දින කථානායකතුමා විසින් කරන ලද නිවේදනවලට අමතරව, තේරීම් කාරක සභාව විසින් මතු සඳහන් මන්ත්‍රීන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභිකයින් වශයෙන් නම් කර ඇත:-

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු චන්දිම ගමගේ මහතා"

**6. කල් තැබීම (රට පුරා විදුලි සැපයුම බිඳ වැටීම) :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි පාර්ලිමේන්තුවේ සභානායකතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

"ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය යුතුය"යි ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 2.05 ට ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.)

"ගරු ජේ. එම් ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය යුතුය"යි ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා යෝජනා කළේය.

(අ. භා. 3.00 ට ගරු ජේ. එම් ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය.)

"ගරු ශෙහාන් සේමසිංහ මහතා මූලාසනාරූඪ විය යුතුය"යි විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 4.00 ට ගරු ශෙහාන් සේමසිංහ මහතා මූලාසනාරූඪ විය.)

"ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ විය යුතුය"යි මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 4.38 ට ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ විය.)

"ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය යුතුය"යි ගරු නලීන් බණ්ඩාර ජයමහ මහතා, ගරු මුජිබුර් රහුමාන් මහතා ස්ථිර කරමින් යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 5.10 ට ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ. භා. 6.47 ට, අද දින සභා සම්මතිය අනුව 2016 මැයි මස 03 වැනි අඟහරුවාදා අ. භා. 1.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.